PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2021-09-14

## ඉදිරි මැතිවරණ වලදී ඡන්දදායකයාට අල්ලස් ලබාදුනහොත් මන්ත්‍රී ධූරය අහෝසියි - මැතිවරණ ඉතිහාසයේ තවත් තීරණාත්මක නඩු තීන්දුවක්

ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයට ඓතිහාසික පරිච්ඡේදයක් එක් කරමින් මොණරාගල මහාධිකරණ විනිසුරු රංග දිසානායක මහතා ඊයේ (13) දිනයේදී සුවිශේෂී නඩු තීන්දුවක් ලබාදුන්නේය.

ඒ පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ එක් පළාත් පාලන ආයතනයක අපේක්ෂකයෙකු මැතිවරණ කාලසීමාව තුළ ඡන්දදායකයන්ට විවිධ අල්ලස් ලබාදීම සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේද සහාය ඇතිව ගොනු කරනු ලැබූ නඩුකරයට අදාල තීන්දුව ඊයේ ප්‍රකාශයට පත්කරමිනි.

ඒ අනුව අල්ලස් ලබාදී ජයග්‍රහණය කල අපේක්ෂකයා පළාත් පාලන මන්ත්‍රී ධූරයෙන් ඉවත්කල අතර ඊළඟ වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂකයා පත්කරන්නට නියෝග කරන ලදී.

මෙම ඓතිහාසික නඩු තීන්දුව මගින් අනාගතයේ අපේක්ෂකයන් ඡන්දදායකයන්ට අල්ලස් ලබාදීමට නොපෙළඹෙනු ඇත. යම් හෙයකින් එසේ කෙරුවද ඕනෑම මොහොතක ඔවුන්ගේ  මන්ත්‍රී ධූරය අභියෝගයට ලක්කිරීමට ඉඩකඩ සැලසෙනු ඇත. එපමණක් නොව අපේක්ෂක වියදම් සීමාකිරීමේ නීති සම්පාදනයේ අවශ්‍යතාවය හා මැතිවරණයකදී සමබිමක අවශ්‍යතාවය නැවත වරක් අවධාරණය වී ඇත.

එමෙන්ම මෙම ජයග්‍රහණය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකිවූයේ තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීම හේතුවෙනි

මෙම නඩුකරය අප පවත්වාගෙන යනු ලැබුවේ බාධක රාශියක් මධ්‍යයේය . ඒ සඳහා සහාය විය යුතු ඇතැම් ආයතන මගහැර යද්දි අතිශය කැපවීමක් සිදුකල නීතීඥවරුන් දෙපළට ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු දෙනාගේ ගෞරවය හිමිවිය යුතුය. එමෙන්ම ඒ සඳහා අවංකව සහාය දැක්වූ මැතිවරණ නිලධාරීන්ටද මෙය සතුටට කරුණක් වනු ඇත. එමෙන්ම මේ සඳහා වෙහෙසවූ සිවිල් සංවිධාන නියෝජිතයින් හා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටද ස්තූතිවන්ත වෙමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

14-09-2021

**A timely reminder that bribing the voters at future elections will result in the Perpetrator losing the seat**

**A decisive and landmark judgment in the history of elections in Sri Lanka**

Mr. Ranga Dissanayake, High Court Judge, Moneragala has delivered a landmark judgment on 13th September 2021 opening a new chapter in the history of elections in Sri Lanka.

This judgment has been given in respect of a case filed by PAFFREL in collaboration with loosing candidate and the Centre for Monitoring Election Violence against a candidate of one of the local government bodies in the Moneragala District for offering various kinds of bribes to the voters at the last local government elections.

The judgment declared the candidate who had purportedly won the seat by bribing the voters as null and void and accordingly he was removed by order of the Court and the candidate who had secured the next highest number of votes was ordered to be appointed to fill the vacant position.

This historic ruling will serve as a deterrent to future candidates in bribing the voters. Even if they continue to bribe, their election will be liable to be challenged subsequently. In addition, the need for enacting laws to limit election expenses by candidates and provision of a level playing field for all candidates in an election has been re- emphasized.

Also, it is important to note that the implementation of the Right to Information Act has paved the way for procuring the information required for this victory.

We were compelled to pursue this case in the midst of many obstacles. The two lawyers who have given their utmost commitment in this case while certain institutions that ought to have supported our endeavor had avoided their responsibility, deserve the respect and gratitude of all those who value democracy. This achievement will certainly be a source of joy to the election officials who have supported it sincerely. Also we wish to thank all the civil society representatives and staff who have worked hard towards this achievement.

Rohana Hettiarachchi
Executive Director